# 03

# රිසාලත් හා හිදායත්

දේව ධර්ම දූතයන් යන අය අල්ලාහ්ගේ මගපෙන්වීම මෙලොවට දේශන කිරීමේ සේවය ඉටු කළහ. ඔවුන් තුළින් මිනිස් සමූහය දේව මගපෙන්වීම ලබා ගත්හ. ඔවුන්ට අල්ලාහ් විසින් ප්‍රදානය කරන ලද මගපෙන්වීම, දේශනා "රිසාලත්" (ධර්ම දූත මෙහෙවර) යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම රිසාලත් මිනිසා යහමග යැවීමට අත්‍යවශ්‍යය වේ. අවනත වීමේ හැඟීම ඇති කරනු ලබන්නේ ය. අල්ලාහ් තමා ප්‍රියකරන්නන් වෙත පමණක් මෙය "හිදායත්" යනුවෙන් පවසයි. මෙය පහත සඳහන් සාධක මගින් වටහාගත හැකි ය.

01. මිනිස් දැනුම, තාක්ෂණික දියුණුව හා විද්‍යාත්මක සොයා ගැනීම් නිසාවෙන් වාර්තා තබමින් පවතියි. නමුදු, සාරධර්මවලට එහි කිසිඳු ස්ථිරසාර, තනි මගපෙන්වීමක් ලබාදීමට තරම් ශක්තියක් නොමැත. එහෙයින්, මිනිසාට ගුණාත්මක සාරධර්ම හඳුනා ගැනීමටත් ඒවා රැක ගනිමින් ජීවත් වීමටත් දේව මගපෙන්වීම අත්‍යවශ්‍යය වේ. තව ද, වසං වූ කරුණු පිළිබඳ දැනුම ලබාගැනීමටත් ඒ කෙරෙහි විශ්වාසය තැබීමටත් ඒවා ගැඹුරු අර්ථයෙන් විශ්වාස කිරීමටත් දේව මගපෙන්වීම් අවශ්‍ය වන්නේ ය. පහත සඳහන් අල් කුර්ආන් වැකිය තුළින් පැහැදිලි ව ම මෙය ගෙනහැර දක්වන්නේ ය. **කවරෙක් අල්ලාහ්ව (ඔහුගේ ධර්මය) ස්ථිරසාර ව ග්‍රහණය කරන්නේ ද ඔහු නියත වශයෙන් ම ඍජු මාර්ගය ඔස්සේ යොමු කරවනු ලබන්නේ ය** (3:101)



එලෙස දේව මගපෙන්වීම් නොපිළිගෙන තර්ක කරන්නන් පිළිබඳ ව අල් කුර්ආනය ඔවුන් දෙස බලා මෙසේ පවසන්නේ ය.

**"අල්ලාහ් පහළ කළ දෑ අනුගමනය කරනුයි" ඔවුනට කියනු ලැබූ කල්හී, "නැත. අපගේ මුතුන්මිත්තන්ගෙන් අප දුටු දෑ අප අනුගමනය කරන්නෙමුයි" ඔවුහු කියති. බුර බුරා නගින (නිරයේ) ගින්නේ දඬුවමට ෂෛතාන් ඔවුන් කැඳවූව ද (මෙසේ ඔවුහු ඔවුන් අනුගමනය කරන්නෙහි ද?) ( 31:21)**

**02.** මිනිසා මවන ලද අරමුණ නිවැරදි ව වටහා ගත යුතු ය. නැතහොත්, මිනිසා ආශාවන්ට වහල් වී මෙලොව ජීවිතය විනාශ කර ගනියි. පරලොවේ දීත් අපහාසයට පත් වේ. මෙවැනි තත්ත්වයක් තුළ දී ඔහුගෙන් ප්‍රශ්න කිරීමත් ඔහුට දඬුවම් කිරීමත් සාධාරණ නොවේ. එම නිසා පරමාන්ත දින ඔහුට දඬුවම් කිරීමත් අසාධාරණ බව තර්ක කළ ද එය වැරැද්දක් බව පැවසිය නොහැකි ය. නමුදු, අල්ලාහ් නීති ගරුක ය. කිසිදු ආත්මයකට අසාධාරණ ලෙස දඬුවම් නොකරන්නේ ය. එහෙයින්, තම දේව ධර්ම දූතයන් ව ඒවා රිසාලත් තුළින් මිනිසාට ඔහුව මවන ලද අරමුණ පහදා එම පදනම මත ක්‍රියා කිරීමට මගපෙන්නුවේ ය. **එය පැමිණීමට පෙර වේදනාවකින් අප ඔවුන් විනාශ කළා නම් "අපගේ රබ් (පරමාධිපතියාණෙනි) ඔබ අප වෙත රසූල්වරයකු නොඑව්වේ මන්ද? එසේ නම් අප නින්දවට සහ අපකීර්තියට පත්වීමට පෙර අපට ඔබගේ ආයාත් (වදන්) අනුගමනය කළ හැකිව තිබුණේ" යැයි ඔවුන් කියනු ඇත. (20:134)**

මෙම වැකිය මගින් දේව මගපෙන්වීම ලබා දුන් පසු ව අල්ලාහ් විසින් ත්‍යාග හෝ දඬුවම් ලබා දෙනු ලැබේ, යන්න වටහා ගත හැකි ය.

**03.** මිනිස් සමූහය යහමගෙහි යැවීමට ශ්‍රේෂ්ඨ ආදර්ශයක් අත්‍යවශ්‍ය ය. මිනිස් සිත් සතන් තුළ පුහු ප්‍රචාරයක් ඇති කරන්නා වූ බලපෑමට වඩා විශාල බලපෑමක් ප්‍රායෝගික ආදර්ශයන්ට ඇති කළ හැකි ය. එවැනි බලපෑමක් ඇති කරන්නන් ලෙස දේව ධර්ම දූතයෝ පිළිඹිබු වූහ. එමගින් රිසාලත් දේව මගපෙන්වීම උදෙසා මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි , යන්නට ඔවුහු ශාක්ෂ්‍යය දරති. එහෙයින්, ඔවුන් පිළිබඳ ව අල් කුර්ආනය මෙසේ ප්‍රශංසා කර ඇත.

**(නබිවරයාණෙනි) අල්ලාහ් යහමග පෙන්වූ අය වන්නේ ඔහු ම ය. එබැවින් (නුඹ ද) ඔවුන්ගේ යහමග අනුගමනය කරනු. (6:90)** යනුවෙන් ඔවුන් දෙස බලා අල් කුර්ආනය සඳහන් කරයි.

**04.** මිනිස් ජීවිතයට මග පෙන්වීමේ සුදුසුකම මිනිස් දැනුමට ලබා දුන්නේ නම්, මිනිස් සමූහය බෙදුම් දහසකට බෙදේ. "එක්සේසත්කම" යන්න සිදු කළ නොහැක්කක් බවට පත් වේ. මෙම තත්ත්වයෙන් රිසාලත් මිනිස් සමූහය ආරක්ෂා කරන්නේ ය. සියලු දෙනා අනිවාර්යයෙන් ම සමගියෙන් සිටිය යුතු අවස්ථා පෙන්වා දී ඔවුන් සාමකාමී කරන්නේ ය.

මිනිස් සමූහයට දේව මගපෙන්වීම අත්‍යවශ්‍යය ම කරුණක් බැවින් අල්ලාහ් අරම්භයේ සිට ම දේව ධර්ම දූතයන් එවමින් සිටියේ ය. සුහුෆ් හා ආගම් පහළ කළේ ය.

මුස්ලිම් බැතිමතකු අල්ලාහ් විසින් පහළ කරන ලද ආගම් සියල්ල ම පිළිගත යුතු ය. ඊට මෙවැනි වැකි ශාක්ෂ්‍යය ලෙස දක්නට ලැබේ.

" ඔවුහු සියල්ලෝ ම අල්ලාහ් ව, ඔහුගේ මලක්වරුන් ව, ඔහුගේ දේව ග්‍රන්ථ හා ඔහුගේ රසූල්වරුන් ව විශ්වාස කරන්නාහු ය" (2: 285 )

ආගම්වලට පෙර පහළ කරන ලද සුහුෆ්හි සංඛ්‍යාව 110 ලෙස සඳහන් වේ. එනම්,

| | | | |
|---|---|---|---|
| ආදම් (අලෛ) තුමාට | 10 | ෂීද් (අලෛ) තුමාට | 50 |
| ඉද්රීස් (අලෛ) තුමාට | 30 | ඉබ්රාහීම් (අලෛ) තුමාට | 10 |
| මූසා (අලෛ) තුමාට | 10 | | |

මේ අතරින් ඉබ්රාහීම් (අලෛ) තුමාට හා මූසා (අලෛ) තුමාට පහළ කරන ලද සුහුෆ් පිළිබඳ ව පමණක් අල් කුර්ආන්හි ප්‍රකාශයට පත් කර ඇත. එලෙස,

මූසා (අලෛ) තුමාට තව්රාත් ආගම ද
දවූද් (අලෛ) තුමාට සබූර් ආගම ද
ඊසා (අලෛ) තුමාට ඉන්ජීල් ආගම ද
මුහම්මද් (සල්) තුමාට ෆුර්කාන් ආගම ද පහළ කෙරුණි.

ඉහත සඳහන් කරන ලද සියලු ම ආගම් අල්ලාහ් විසින් පහළ කරන ලද්දක් බව අප විශ්වාස කළ යුතු ය. ඒ සමග ම අවසාන ආගම වන අල් කුර්ආනය පිළිපැදීම යහමග උදෙසා වූ අවසාන තෝරා ගැනීම යන්න ස්ථිර කර ගත යුතු ය.

අභ්‍යාස

01. ආගම්, සුහුෆ් පහළ කරන ලද නබිවරුන්ගේ නම් ලැයිස්තු ගත කරන්න.

02. මිනිස් සමූහයට යහමග පෙන්වීමට රිසාලත්හි අවශ්‍යතාව හඟවන සාධාරණ හේතු ගෙන හැර දක්වන්න.